2008 වසරේ විශිෂ්ටතම නළුවා ධර්මප්‍රිය ඩයස්

සම්මානයක් කියන්නේ අපේ හැකියාව තවත් කෙනෙකුට ඔප්පු කළ හැකි සාක්ෂියක්

ඒ නිසා ලැබුණු මේ සම්මානය ගොඩක් වටිනවා

නළුවකු යැයි කියූ විට අප හෙන්මා-ගයේ සැරසිසරන්නේ කඩවසම් රූවකින් යුත් ආකර්ෂණීය පුද්ගලයෙකි. නළුකමට එකී අංගයන් ද බෙහෙවින් අවැසි මුත් සැබෑ රංගකය යනු එය හොවේ. සාම්ප්‍රදායික උස්තුංග නළු ප්‍රතිරූපයෙන් පරිබාහිර අයකුට වුව ද සැබෑ රංගවේදියකු විමේ වරම හිමි වන්නේ ඔහුගේ රංගන විශිෂ්ටත්වය හරහාමය.

ඒකදා අවැසි මුග්ධ සාධකය වන්නේ තුෂ්ඨ රංගන පෙරදැයෙකි. තුෂ්ඨ විත්ත එය නළුවාගේ ආකෘතිස්වරූපය ඉක්මවා යන්නකි.

ධර්මප්‍රිය ඩයස් 32 වැනි 'සරසවිය' සම්මාන උළෙලේ 2008 වසර සඳහා හොඳම නළුවා ලෙසින් සම්මානය ලැබූ පළමු සහ සාරවත් පරිණත සත්‍යය යළිත් අප සමුවේ සනාථ කරමිනි.

ඔහුට එම සාධකය උදා කරදුන්නේ උබර්කෝ ඇසෙලිනි අධ්‍යක්ෂණය කළ 'මාධ්‍ය' චිත්‍රපටයයි. ඔහු එම සම්මානය හිමි කර ගන්නේ නිර්දේශිත කාණ්ඩයන් අතරට එකී 'වලාපාටල්' චිත්‍රපටයේ ගාමිණී හත්කොටුවේ එම සඟ අබා චිත්‍රපටයේ කෙනෙලියනගේ වැනි විශිෂ්ටයන්ගේ රංගප්‍රතිභාව උච්ච-ම්මිනි.

ධර්මප්‍රිය ඩයස් නොගොත් ඩයිනා අද 'සරසවිය' පත් ඉරු අතරට මෙසේ එක් වන්නේ එම සම්මානයේ සතුටා හා අභිමානය දැසින් දැක්ගිරා ගොඩකය.

මෙවැනි දුවන්න සම්මානයක් ලැබීම ඇත අවංකවම මගේ හිතේ තියන්නේ හිතකමකි සතුටක් අපි කරන දේට ඇගැයීමක් ලැබෙන කොට අපි තවත් ධෛර්යමත් වෙනවා. ඇතැම් ඊළඟ නිර්මාණවලදී අපි මේක තැන්කෙනින් තියන්න ඕනෑ. තැනිතමම වැඩි කරියට කරන්න අමාරුයි.

සම්මානක් නතුරට හිටින වෙලාවල් තියෙනවා කියලද ඔබ කියන්නේ?

ඔව්, සම්මානයකින් හොඳ වගේම තරහක් සිද්ධ වෙනවා. එහෙම වන්නෙක් පමණයි මේ වගේ දේවල් ලැබුණම 'අඳගත්ත තියයි. එහෙම වුණාම අර වඳුරාට දැලි පිහිය හම්බ වුණා වගේ මම නම් මේ සම්මානය මට ලැබුණා කියලා කොරුවට රැඩිකල් වෙන්න යන්නේ නැහැ.

ඒවගේම සම්මානයකින් අපට සැලසෙන තවත් වාසි තියෙනවා. අපි කොහෙ හරි රටකට යද්දී ඒ සම්මාන පත්‍රිකණ ආදියට පෙන්නන්නත් ඔය සම්මාන ප්‍රයෝජනවත් වෙනවා. අනෙක් අතින් සම්මානයක් කියන්නේ අපේ හැකියාව තවත් කෙනෙකුට ඔප්පු කරන්න පුළුවන් සාක්ෂියක්

සම්මානයේ පදනම්ක වටිනාකමක් එක්ක ඔබට මුදල්මය තිළිණයකුත් හිමි වුණා. එයත් මේ තීන්දුවේ විශාල වෛද්‍යයක්?

ඇත්තටම ඒක අපේ රටේ රංගන කලාකරුවෙකුට විශාල සහනයක්. මම ඒකෙන් පරිණාමය වගයක් ගෙවීවා

ඔබ මේ සම්මානය හිමි කර ගන්නේ ගාමිණී හත්කොටුවෙගම, සොමතිලියකගේ වැනි විශිෂ්ට රංගවේදීන් අභිබවමින්?

අපි අතරේ තරගයක් තිබුණා කියලා මට හිතෙන්නේ නැහැ. ප්‍රේක්ෂකයා මගේ ඇතිවිරුද්ධ ඇත්තේ ගාමිණී හත්කොටුවෙගම සහ සොමතිලියගේ අතරින් මගේ කැමැත්ත මට ලැබෙන්නේ නැති වීම ගැන ඇත්තටම මට සසලයි.

ඔබට කොහොමද මේ අවස්ථාව උදා වුණේ?

'මාධ්‍ය' පිටපත් රචකයා රුවන්ති ඩී එකේරා මාව වේදිකා නාට්‍යය හරහා හඳුනාගෙන සිටියා. මේ තීරිපිටපත ලියාගෙන යද්දී ඇයට මාව මතක වුණා. ඒ ඇයගේ කිව්වොත් මම ඔහුගෙන් මගේ රංගනයට යම් යම් දේ එකතු කර ගත් කෙනෙක්. ඔහුත මම යොමත් එක්ක රාජිත දිසානායකගේ 'අපසු හැරෙන්න බැ' වේදිකා නාට්‍යයේ එකට රඟපෑවා.

මේ චරිතයට මෙවැනි සම්මානයක් හිමි වෙයි කියා ඔබ සිතුවාද?

මුලින්ම සම්මානයක් ගන්න එක ගැන හැඟවුව ආවේ නැහැ. හැබැයි මම දැනගෙන හිටියා මේ චිත්‍රපටයේ මගේ හැකියාව ජාත්‍යන්තර තලයට යයි කියලා උබර්කෝත් තැංකොලින් නිර්යන්තේ මීට පෙර චිත්‍රපට කරලා බෙහෙවින් කාර්යභාර අධ්‍යක්ෂවරයෙක් කියන්නේ මා දැකගෙන හිටියා අපේ රටේ ජීවන අත්දැකීම් වෙනත් රටක කෙනෙක් දැකලා එයින් නිර්මාණයක් නිර්මාණ කරලා මෙවැනි සම්මානයක් නිර්කරලා මෙවැනි සම්මානයකට මගේ දායකත්වය ලබා දෙන්න හැකි වීම ගැන ඇත්තටම මට සතුටුයි.

ඔබට කොහොමද මේ අවස්ථාව උදා වුණේ?

'මාධ්‍ය' පිටපත් රචකයා රුවන්ති ඩී එකේරා මාව වේදිකා නාට්‍යය හරහා හඳුනාගෙන සිටියා. මේ තීරිපිටපත ලියාගෙන යද්දී ඇයට මාව මතක වුණා. මාව ඔළුවේ තියාගෙන තමයි ඇ ඊට පස්සේ මේ තීරිපිටපත ලියා තිබුණේ.

හැබැයි වේදිකාවේ රුවන්ති කලුකින් මාව දැකලා තිබුණේ නැහැ. ඔයා චිත්‍රපටයේ ඉන්න වටේ තුන් ගුණයක් විතර මම මතකයි. ඒ දවස්වල තමයි මම සරදියෙල් ටෙලි නාට්‍යයේ සිරිමලා විදිහට රඟපෑවේ. කොණ්ඩෙ, රැවුල දිගටවලා තිබුණේ. මාව දකුපු ගමන් උබර්කෝ රුවන්තිගෙන් ඇහුවලු 'ඔබට පිස්සුද' කියලා. ඒත් එදා ඔහුගේ හොටෝවක් ඉල්ලා ගන්නා

චිත්‍රපටයේ ප්‍රධාන චරිතයට කෝරා ගැනීම දක්වා එය දිග් ගැසුණේ කොහොමද?

මාස දෙකකට පස්සේ ඔහු ආයෙත් මට කතා කළා. එදා රැවුල, කොණ්ඩෙ කපලා ගියේ ඒත් මගෙන්. ඔහොම තුන් තරං පාරක් මට කතා කරලා එක එක සීන් රීසේසි කරන්න තිබිලා.

අන්තිමට උබර්කෝ මට ඔහුගේ කාර්යාලයට එන්න කියලා 'අපි මේ චරිතයට ගොඩක් අය බැලුවා. උඹ හොඳට ඒත් මගත වැඩියි තිබිලා

ඊට පස්සේ?

මේ වෙන කොට උබර්කෝ ගැන මගේ තිබුණේ ලොකු පැහැදීමක් ඇති වෙලා තිබුණා. මම ඔහුගෙන් ඇහුවා උඹ කියන තත්ත්වයට එන්න කොච්චර කාලයක් දෙන්න පුළුවන්ද කියලා. මට අවශ්‍යය දේවල් පපරනවා. තමා සැකෙකින් ඒක කරන්න පුළුවන් කියලත් මම ඔහුට කිව්වා. උබර්කෝත් අදහසට එකඟ වුණා. ඊට පස්සේ මම හොතා නොකී, නොකඩවා වානාම කරමින් තමයි චිත්‍රපටයේ ඔය ඉන්න තත්ත්වයට ආවේ.

විශාල කූප කිරීමක් දැ ලබා ගන්නේ ජයග්‍රහණයක් එතකොට මේ?

තවවෙක් දැසද, මතද, මිටිද, කළඳ කියන එක තෙවෙයි ප්‍රශ්නය. ඔහු යම් වර්තයක් දෙනුවෙන් කරන කූප කිරීමයි අද වේවේ-කිව

ඔහු රංගනයට අති විශිෂ්ටයකු වූ හැටි මෙන්න

ධර්මප්‍රිය ඩයස් කිව්වම අපට තීතැතින් සිහිපත් වෙන්නේ වේදිකාව පුංචි තීරය හරහාත් ඔබ රඟපෑ චරිතයක්. නමුත් සිනමාවේ ඔබට රඟපෑ ස්වරූපයක් තිබුණේ කැමැත්ද?

සතෘප්ත් මාදිපේගේ 'කොරදිය පොතුණ' සුළු චරිතයක් මම රඟපෑවා. ධර්මසිරි චිත්‍රකාන්තගේ 'තනි වේරෙන වේරාන්' චිත්‍රපටයේත් චරිතයක් තිරපණය කළා. ඒත් ඒ චිත්‍රපටදෙකම සටහන් තීරගත වුණේ නැහැ. ඊට පස්සේ ඒරික ගුණරත්නගේ 'වලාපාටල්' චිත්‍රපටයේත් පුංචි චරිතයක් රඟපෑවා.

සිනමාවේ පරිණත අත්දැකීම් කොතෙකින් ඔබ කොහොමද මේ තරම් කෙටි කලකින් 'හොඳම නළුවා' කියන තැනට තල්ලු වුණේ?

වේදිකාවේ, පුංචි තීරයේ හෝ සිනමාවේ වේවා මාව යම් චරිතයකට කෝරා ගන්නට පස්සේ මම උපරිම විදිහට මගේ වගකීම ඉටු කරනවා මමම්තින්නේ 'මවා' චිත්‍රපටයේ දී සිදු වුණේත් ඒ දේමයි. මම, මගේ ඩයුටිය හොඳට කළා කියලා ජූරිය තීරණය කරන්න ඇති.

වගකීම ඉටු කළ පමණින් විශිෂ්ට රංගන ශිල්පියකු වෙන්න බැහැනේ. ඒ සඳහා මොනෙක්ද කළ යුතුයි?

මම තීතන්නේ රංගන ශිල්පියකුට වඩාත්ම අවශ්‍යය වන සාධකය තමයි රංගන පෞරුෂය. තීරන්ත-රයෙන් වේදිකා නාට්‍යවල රඟපෑමෙන් ලැබුණ පළපුරුද්ද තමයි මගේ තීතන්නේ මේ තැනට එන්න. අපේ රටේ රංගන පාසල් නැහැනෙ. නමුත් අපේ මිතුරු සමාගමක් තියෙනවා. අපි තීරන්තරයෙන්ම අපේ වීසෙයෙක සංවාදයීලී වෙනවා. අපේ මළකඩ අපිම කඩා ගනිමු කියලා වර්ත්මොත්ස් තියනවා. මහාචාර්ය සිස්ස කාරියවසම්, කොලොනා ප්‍රතාත්දු වැනි අය ගෙන්වාගෙන අපි මේ සැක සංවාදයකට එළඹෙනවා.

කමුදු ඔය මිතුරු සමාගමේ සාමාජිකයන්?

ජයතිලක්සොනායක, ගිහාන් ප්‍රතාත්දු, දයා-දේව එදිරිසිංහ, ඩබ්ලිව් ජයසිරි, බිමල් ජයකොඩි, ප්‍රියංකර රත්නායක, ප්‍රසාද් සූරියආරච්චි, ගාමික ගන්ලතවත්ත, රාජිත දිසානායක, සූජිත දමේල් ඇතුළු සැනෑ පිරිසක් මේ මිතු සමාගමේ ඉන්නවා. ඒ ගොඩක් අය මට වඩා සීනියර් අපි එකතු වෙලා රංගනය ගැන වගේම රටේ ආර්ථික, සාමාජීය, දේශපාලන ප්‍රශ්න ගැන සාකච්ඡා කරනවා. සොත පත ඇසුරෙන් රංගනය පිළිබඳ සොයා ගත් අදහස් දැසාමාජිකයන්ට බෙදා හදා දෙනවා. මිතුරුකමට හොඳ කියන්නෙන් තැහැ. වැරැද්දක් තියෙනවා නම් සකසා ගත යුත්තේ කොහොමද, කොතනද කියලා අපි විවෘතව කතා කරනවා. අන්තිමට හොඳ අවුට් පුට් එකක් කමයි මේ සියලු දේ හරහා අපි බලාපොරොත්තු වෙන්නේ.

අපේ සිනමාවේ ඔබ ගුරු කොට තකන එහෙම තැනිනම් ඔබ වඩාත් කැමති රංගන ශිල්පියකු පිටිතවාද?

එහෙම පරමාදර්ශී නළු චරිතයක් නම් මට තැහැ. ඒත් සිනමා සත්වීඛ ගාමිණී ෆොන්සේකා, ජෝ අබේවික්‍රම යන විශිෂ්ට රංගන ශිල්පීන් දෙපළට මම බෙහෙවින් ප්‍රිය කරනවා. ඔවුන්ගේ රංගනයේ සියුම් තැන්, ප්‍රබල තැන් ඇතැම් විට අපට රංගනයේදී අත්-පොත් වුණ අවස්ථා තියෙනවා.

වේදිකාවේත් මම ප්‍රිය කරන කීපිප දෙනෙක් ඉන්නවා. ඒ අය එක්ක වැඩ කරන්නත් මම කොහොම කැමැතියි. සුමිත්ද පිරිසේන, රන්තා ලාල්ගි ජයකොඩි, වාත්ගි සෙනෙවිරත්න, මහේන්ද්‍ර පෙරේරා සොමතිලියගේ ඒ අතරින් ප්‍රමුඛතමයන්.

ඔබ වේදිකාවෙන් උසස් නළුවෙක් කිව්වොත් කියැදිදි. මේ සුවිශේෂී මොනොතේ ඔබේ ආරම්භය ගැන්න පුංචි සිහිපත් කිරීමක් කළොත් වටිනවා?

කැස්සෑවේ මගේ ගෙවල්වලට එනා තැන්නේ තමයි ශ්‍රීපති දැන්ම පාසල් තිබුණේ. මගේ රංගන ගැතියාවන් එළි දක්වන්න හොඳ තෝතැන්නත් වුණේ ඒ ගම්ම පාසල් සහ මම අධ්‍යාපනය හැදෑරූ පිළිදන්දර මධ්‍ය මහා විද්‍යාලය. ප්‍රේමකුමාර කරුණාරත්න තමයි මගේ නාට්‍යය ගුරුවරයා. එයෙමිනුදි එක දවසට මම මොකවා හරි දෙයක් ඉදිරිපත් කරනවාමයි 'මුතුහර' ලමා සමාජයටත් මම සම්බන්ධ වෙලා හිටියා. මට මතකයි 'මාලිමා', 'මුතු ඇවෙ ගීතය' වගේ වේදිකා නාට්‍ය-වලින් අපි රාජ්‍ය නාට්‍යය උළෙලේ දෙවැනි වටයටත් ආවා.

එතකොට ඔබ ප්‍රසිද්ධ වේදිකාවට පා තැබුවේ?

පාසල් කාලෙන් පස්සේ තමයි මම පිටිය ජෙෂෙෂ්ඨ ශිෂ්‍යයෙක් එක්ක මගේ පාසල් නාට්‍ය වේදිකාවට ප්‍රවේශ වුණේ. ඒ කාලේ මගේ ගෙවල්වලට එනා තැන්නේ තමයි ශ්‍රීපති දැන්ම පාසල් තිබුණේ. මගේ රංගන ගැතියාවන් එළි දක්වන්න හොඳ තෝතැන්නත් වුණේ ඒ ගම්ම පාසල සහ මම අධ්‍යාපනය හැදෑරූ පිළිදන්දර මධ්‍ය මහා විද්‍යාලය. ප්‍රේමකුමාර කරුණාරත්න තමයි මගේ නාට්‍යය ගුරුවරයා. එයෙමිනුදි එක දවසට මම මොකවා හරි දෙයක් ඉදිරිපත් කරනවාමයි 'මුතුහර' ලමා සමාජයටත් මම සම්බන්ධ වෙලා හිටියා. මට මතකයි 'මාලිමා', 'මුතු ඇවෙ ගීතය' වගේ වේදිකා නාට්‍ය-වලින් අපි රාජ්‍ය නාට්‍යය උළෙලේ දෙවැනි වටයටත් ආවා.

එතකොට ඔබ ප්‍රසිද්ධ වේදිකාවට පා තැබුවේ?

පාසල් කාලෙන් පස්සේ තමයි මම පිටිය ජෙෂෙෂ්ඨ ශිෂ්‍යයෙක් එක්ක මම යනවා ප්‍රවීණ නාට්‍යවේදී බන්දුල විතානගේගේ හමුවන්න. ඔහුගේ 'රෝමියෝ ජූලියට්' වේදිකා නාට්‍යයට මම සම්බන්ධ වුණේ පොළ මතක් කරන්න සහ සහාය වේදිකා පරි-අධ්‍යක්ෂණය කළ 'දක මල්ලිගේ මොණලිසා' නාට්‍යයට මට හොඳම වේදිකා පරිපාලකයට සම්මාන ලැබුණා 2004 වසරේදී.

ඔබේ වේදිකා නාට්‍යයේ තිත්තාදායක කලා?

මට 'ගැහැනු වැඩ අරන්නම් කියන නාට්‍යය හොඳම රංගන විත්තනයට 2005 රාජ්‍ය නාට්‍ය උළෙලේදී මට සුදුසුම් වීමේම සම්මානයක් ඊට හිමි වුණා.

මේ දිනවල ඔබ පුංචි තීරයේත් අතිශය ජනප්‍රිය චරිතයක්?

වෙස්ටන් වීඩියෝස් කියන්නේ 'අමිර්' ඊට පස්සේ වෙලි නාට්‍යයේ යයදේවගේ චරිතයට මට දොළොස්වන ප්‍රතිභාවයක් ලැබෙනවා. තමන්ගේ කැමැති කියා ගොඩක් ප්‍රශ්නවලදී මදි වෙන කෙනෙක් ජයදේව. මිනිහා වලියට ගරලිත හොඳ පොරක් මේ චරිතය පරක් ඔලුවේ 'අමිර්' ඊට පස්සේ මිනිහා කියන්නේ තිබුණේ නැහැ. මට ඒ පුදුමයි. එහෙම චරිතයක් මේ තරම් ජනප්‍රියවුණේ කොහොමද කියලා.

වේදිකාව, සිනමාව, පුංචි තීරය කියන මාධ්‍යයන් තුනෙන් ඔබ වඩාත් කැමති මාධ්‍ය තුනක් ද කියා මා ඇහුවොත්?

අවංකවම කියනවා නම් වේදිකාවේ එකට මම ගොඩක් කැමතියි. මම වැඩිපුර වැඩි කරලා තියෙන්නේ වේදිකාවේ. එහෙම ආර්ථික ප්‍රතිලාභයක් නැතත් තවම අපි වේදිකාවේ රැඳිලා ඉන්නේ වේදිකාවට තියෙන ආදරය නිසයි. ඒත් වයසට යනකොට අපේ ජීවය, ශක්තිය ක්ෂය වෙලා යනවා වේදිකාවේ.

නමුත් සිනමාව කියන්නේ සංරක්ෂිත මාධ්‍යයක්. අමිර් ඛාන් දැන්නේ අපේ කරන්නේ අමිනාබ් ඛච්චන් රූප මාධ්‍යයට සුපිරි කරුවන් 'සිනමාවේ තරු හොඳක්කත් හොඳම' කියන තැන තමයි මම ඉන්නේ. ඒ තරමටම මේ රූප මාධ්‍ය හරිම අපූරුයි.

රංගනයට ඔබේගේ, සිනමාවට දැයක වෙන්න ඔබේ අදහසත් තැතිද?

මගේ තීතය කවදා හරි හොඳ චිත්‍රපටයක් අධ්‍යක්ෂණය කරන්න. ඒත් දැන්මම හෙවේ අත්දැකීම් ලබලා සිනමා මාධ්‍ය තුනයම පරිණත වෙන්ඩ ඇති වුණාට පස්සෙයි මම ඒ වැඩේට අත ගහන්නේ. මගෙන් සේකර කළේ කුමං තෙද්දිය' චිත්‍රපටය විතරයි. ඒ වගේ එක විශිෂ්ට නිර්මාණයක් බිහි කරන්න පුළුවන් වුණොත් ඒකම මට ඇති.

අපි තැතැයි ඔබේ ජෛද්ලීක තොරතුරු ටිකකුත් දැනගන්න?

මම විවාහකයි. බිරිඳ අනෝජා මිලන්ති. මට එකම පුතයි ඉන්නේ. එයා ස්වර්ණ රාවණ ඩියස්. තාම අවුරුද්දයි පුතාට ඇති. කටම මගේ බිරිඳගේ මගේ කලා කටයුතුවලට ලොකු සහායක් ලැබෙනවා. මගේ කාර්ය බහුලත්වය නිසා පවුලේ සියලු කටයුතු බලා ගන්නේ ඇයයි.

බොහෝ දෙනෙක් දන්නේ ඔබ කවුළුවක් කියා පමණයි. ඒත් ඔබ වැන්නියෙන් ගුරුවරයෙක්?

ඔව්, මම දෙකිවල ශාස්ත්‍රාගාරයේ වැදගත්වේ චිත්‍ර, නාට්‍ය හා රංගන කලාව පිළිබඳ ගුරුවරයා විදිහට සේවය කරනවා. මා ගුරු වෘත්තියේ සියැළි පිටින් සැරෙන්මක් තැතිමයි. විදුහල්පතිවරි. ඒ වගේ පතිරණ මහතාගේ මගේ කලා කටයුතුවලට විශාල සහයෝගයක් ලැබෙනවා.

'සිනමාවේ කළ නොහැක්කක් නොමැත' කියන තැන තමයි මම ඉන්නේ. ඒ තරමටම මේ රූප මාධ්‍ය හරිම අපූරුයි.

සටහන
අසංක දේවමිත්‍ර පෙරේරා
ජායාරූප

Scan with EasyScan